## පරිසර අමාත්‍යාංශය

# මධ්‍යම පරිසර අධිකාරිය

## CEA/AD/GEN/21/2025

## 2026 වසර සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

මධ්‍යම පරිසර අධිකාරියේ 2026 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ, සේවා හා වැඩ සැපයීම සඳහා පිළිගත් සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අධිකාරියේ 2026 වර්ෂයේ මිලදී ගැනීම් සඳහා මිල ගණන් කැඳවනු ලබන්නේ එම ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් පමණි.

සෑම ප්‍රධාන අයිතමයක් (භාණ්ඩ, සේවා හෝ වැඩ) සඳහාම ආපසු නොගෙවනු ලබන රු. 1500.00 ක ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතුය. මෙම ගාස්තුව මධ්‍යම පරිසර අධිකාරියේ මුදල් අයකැමි වෙත හෝ ලංකා බැංකුවේ පැලවත්ත ශාඛාවේ ගිණුම් අංක 0002937303 ට තැන්පත් කිරීම මගින් ගෙවිය හැකිය. මුදල් තැන්පත් ලදුපතෙහි මුල් පිටපත ඔබගේ අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

සැපයුම්කරුවන් වර්ගීකරණය පිළිබඳ විස්තර, භාණ්ඩ, සේවා සහ වැඩ සඳහා අදාළ අයදුම්පත් හා කොන්දේසි මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවියේ www.cea.lk ප්‍රසම්පාදන දැන්වීම් – සැපයුම් කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම –2026 යටතේ 24.11.2025 දින සිට 21.12.2025 දින දක්වා බාගත කරගත හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය, VAT ලියාපදිංචි සහතිකය (අදාළ වේ නම්), CIDA ලියාපදිංචි සහතිකය (කොන්ත්‍රාත්කරුවන් සඳහා අදාළ වේ නම්) සහ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහතිකය (අදාළ වේ නම්) යන සහතිකවල පිටපත් සමග 21.12.2025 දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදීමට හැකිය. ලිපියේ ඉහළ වම් කෙළවර **"සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම -2026"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, අයදුම්පත් භාර ගැනීමේ හා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සතුවේ.

**අධ්‍යක්ෂ (පරිපාලන),**
**මධ්‍යම පරිසර අධිකාරිය,**
**පරිසර පියස, අංක 104,**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**බත්තරමුල්ල.**
**දුරකථන අංක - 011-2872278, 011-2124623**
**24.11.2025**